රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2010

මගේ අංකය : EST-8/MISLA/05/0132
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
2010.01.15

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## හදිසි මරණ පරීක්ෂකවරුන්ට කරනු ලබන ගෙවීම්

1998.03.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/98 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ X වන පරිච්ඡේදයේ 3 වන වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරවමි. එහි 3:1, 3:4 හා 3:5 වගන්ති පහත සඳහන් අයුරින් සංශෝධනය කරමි.

**3:1** වගන්තිය : මෙම වගන්තියේ සඳහන් හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වීම වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තුව රු.500/-ක් වශයෙන් සංශෝධනය කරනු ලබන අතර, අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී. (මෙම ගාස්තුවට තැපැල් හා ලිපිද්‍රව්‍ය වියදම් ඇතුළත් වේ.)

**3:4** වගන්තිය : පොදු ප්‍රවාහන සේවයක් නොමැති මාර්ගයක යන ගමනක් හෝ ගමනක කොටසක් හෝ සඳහා සැතපුමකට රු.10/- ක් බැගින්ද, පොදු ප්‍රවාහන පහසුකම් සහිත මාර්ගයක යන ගමනක් සඳහා සැතපුමකට රු. 6/- ක් බැගින්ද සැතපුම් කුලිය ගෙවනු ලැබේ.

**3:5** වගන්තිය : ආණ්ඩුවේ වේතනික නිලධාරීන් නොවන හදිසි මරණ පරීක්ෂකවරුන්ට ඉන්ක්වැස්ට් විභාගයක් සඳහා නිවසින් පිටවී සිටීම අවශ්‍ය වන කාල පරිච්ඡේදය වෙනුවෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණ අනුව යැපීම් දීමනාව ගෙවනු ලැබේ.

| | |
|---|---|
| එක් එක් සම්පූර්ණ පැය 24 ක කාලයකට | රු.500/- |
| පැය 12 කට නොඅඩු කාලයක් සඳහා | රු.500/- |
| පැය 06 කට නොඅඩු කාලයක් සඳහා | රු.250/- |

මෙම සංශෝධිත ගාස්තු 2010.02.01 දින සිට ක්‍රියාත්මක වන අතර, ආයතන සංග්‍රහයේ මෙම වගන්තිවල සඳහන් අනෙකුත් නියමයන් තවදුරටත් නොවෙනස්ව බල පැවැත්වේ.

මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකගත්වය මත නිකුත් කරනු ලැබේ.

ඩී. දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය